ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 07 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 12 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 09 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයත් බැංකු ගිණුමකට අදාලව මුදල් පොත අනුව අයිරාව රු. 993,208 ක් වුවද, එය රු. 979,598 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ තුලනතාවය විගණනයේදී ගැටළුසහගත විය.

(ආ) අවිස්සාවේල්ල හා රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණ වෙතින් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උසාවි දඩ ආදායම් ලැබිය යුතුව තිබියදී සමාලෝචිත වර්ෂය තුලදී ජ'නල් සටහන් මඟින් වැඩියෙන් බිල් කිරීම් ලෙස රු. 563,249 ක් සමුච්චිත අරමුදල මඟින් කපා හැර ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ආයුර්වේද මධ්‍යස්ථාන 04 ක සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි ඖෂධ තොගය රු. 584,088 ක් ලෙස භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තහවුරු වුවද, එය රු. 577,056 ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වා දී තිබූ ගංවතුරෙන් විනාශ වී තිබූ පොත්වල වටිනාකම වූ රු. 76,346 ක් පුස්තකාල පොත් ගිණුමෙන් ඉවත් කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙනු ලැබුවද විවිධ තැන්පත් ගිණුමේ හා විවිධ තැන්පත් ලේඛණය අතර පැවති රු. 2,302,797 ක වෙනසට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතු කළ අගය මත බදු වටිනාකම රු. 955,418 ක් ලෙස ලේඛණ මගින් තහවුරු වුවද, එය දෝෂසහගතව රු. 2,199,749 ක් ලෙස දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු. 52,250 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 16 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 11,986,005 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

2013 වර්ෂයේදී මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ බෙදා දී තිබූ රු. 2,467,708 ක වටිනාකමැති උපකරණ හා රු. 198,498 ක් වටිනාකමැති ආවරණ මඩු 03 ක් බෙදා දීමේදී අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ආධාර ලබා දියයුතු අයටම අදාල උපකරණ ලබාදුන් බවට කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>132(ඔ) වගන්තිය | විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සුභසාධන හා අවමංගල්‍යාධාර සමිති වැනි සංවිධාන සඳහා එකතුව රු. 375,495 ක් වටිනාකමැති භාණ්ඩ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සභා අරමුදලින් වැය දරා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජූනි 08 දිනැති අංක 1396/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති | සභා රැස්වීම් හා කාරක සභා රැස්වීම් වලට සහභාගී නොවූ සභිකයින් 14 දෙනෙකු සඳහා රු. 180,000 ක සභික දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2002 අප්‍රේල් 30 දිනැති අංක ප.පා.කො.ඒ./03/(1) දරන චක්‍රලේඛ ලිපිය | සබරගමුව පළාත් සභාවේ බලවින්න කොන්ක්‍රීට් කම්හලෙහි නිෂ්පාදන ප්‍රමිතියෙන් ඉහල බවත්, බලවින්න කොන්ක්‍රීට් අංගනය මඟින් පමණක් හියුම් පයිප්ප මිලදී ගැනීම සිදුකල යුතු බවත්, දන්වා තිබියදී ඊට පටහැනිව කඩුවෙල ප්‍රදේශයේ පිහිටි පුද්ගලික ආයතනයක් මඟින් 2014 වර්ෂයේදී රු. 166,200 ක් වටිනාකමැති හියුම් පයිප්ප 18 ක් මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | 2009 දෙසැම්බර් 22 දිනැති අංක ප.පා.කො.1/2009 (සංශෝධන) දරන චක්‍රලේඛයේ දෙවන ඡේදය | පළාත් පාලන ආයතන සභිකයින් සඳහා සංයුක්ත දීමනා ගෙවීම පිළිබඳව යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකිවන්නේ අදාල පළාත් පාලන ආයතනයේ පරිපාලන කටයුතු වලට කෙලින්ම |

සම්බන්ධ නොවූ සහ බල ප්‍රදේශයෙන් පිටත රාජකාරී කටයුතු නොවූ ගමන් බිමන් සඳහා වුවත් එම විධිවිධාන වලට පටහැනිව 2014 වර්ෂයේ සංයුක්ත දීමනා වශයෙන් රු. 69,000 ක් සභා අරමුදලින් සභිකයින්ට ගෙවා තිබුණි.

(ඉ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

(I) මුදල් රෙගුලාසි අංක 396(ඈ)

චෙක්පත් නිකුත් කල දින සිට මාස 06 කට වැඩි කාලයක් මුදල් කර නොතිබූ චෙක්පත් සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය පැහැදිලිවම දක්වා තිබියදී 2014 නොවැම්බර් බැංකු සැසඳුම අනුව රු. 726,812 ක් වටිනාකමැති චෙක්පත් 127 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(II) මුදල් රෙගුලාසි අංක 1645

සභාවේ කිසිදු වාහනයක දෛනික ධාවන සටහන් වර්ෂ ගණනාවක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ මෙහෙයුම් අයහාරය රු. 3,067,093 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයහාරය රු. 1,522,907 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අයහාරය රු. 1,544,186 කින් වැඩිවී තිබූ අතර, එය සියයට 101 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කුලී, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ, වෙනත් ආදායම් සහ රජයේ දායක මුදල් වල පිළිවෙලින් සියයට 10,

සියයට 45, සියයට 43, සියයට 31 ක හා සියයට 63 ක වැඩිවීම හා සැලසුම් හා උපකරණ, ප්‍රවාහන සම්බන්ධතා වල පිළිවෙලින් සියයට 02 හා සියයට 19 ක අඩුවීමකි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 6,375 | 7,366 | 10,012 |
| බදු කුලී | 4,685 | 4,496 | 1,893 |
| බලපත්‍ර ගාස්තු | 876 | 522 | 38 |
| වෙනත් ආදායම් | 13,569 | 13,348 | 10,489 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු, බදුකුළී ආදායම්, බලපත්‍ර ගාස්තු, සහ වරෙන්තු හා දඩ ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමඟ සැසඳීමේදී රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 9, සියයට 3, සියයට 39, හා සියයට 37 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මාර්තු මස වනවිටත් සමාලෝචිත වර්ෂයට අදාලව බදුකරුවන් 301 දෙනෙකුගෙන් අක්කර බදු රු. 91,903 ක් අයවීමට තිබූ අතර රු. 1,000 ට වඩා වැඩි හිඟ මුදලක් අයවීමට තිබූ 18 දෙනෙකුගෙන් රු. 31,574 ක මුදලක් අයවීමට තිබුණි.

(ආ) සභා සීමාව තුල වරිපනම් ඒකක 6700 ක් පවතින අතර, ඒවායින් 2014 වර්ෂයට අදාල හිඟ වරිපනම් බදු පිළිබඳව වාර්තා විගණිත දිනය වන විටද පිළියෙල කර නොතිබූ අතර, 2014 දෙසැම්බර් 31 දිනට ඒකකයකින් රු. 1,000 ට වැඩි හිඟ මුදල රු. 5,465,621 ක් විය.

2.3.4 බදු කුලී

--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් වෙළඳ සංකීර්ණ වල කඩකාමර වලින් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මාර්තු මස වනවිටත් සමාලෝචිත වර්ෂයට අදාලව රු. 586,182 ක හිඟ මුදලක් අයවීමට තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක පා.පා.කො./2009 දරන චක්‍රලේඛය ප්‍රකාරව යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුළිය සංශෝධනය කල යුතු වුවද, සභාවට අයත් කඩකාමර 71 ක් සම්බන්ධයෙන් ගාස්තු යාවත්කාලීන කිරීමක් සිදු නොකිරීමත්, කල් ඉකුත් වී ඇති ගිවිසුම් යාවත්කාලීන නොකිරීමත්, දිස්ත්‍රික්කයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක පිහිටි මෙම කඩකාමර වලින් වර්තමාන වෙළඳපල මිල තත්ත්වයන් හා සැසඳීමේදී සාපේක්ෂව අඩු කුළියක් අය කරන බවත් නිරීක්ෂණය විය.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මාර්තු මස දක්වාම සිදුකර නොතිබූ බැවින් 2014 වර්ෂයට අදාලව විවිධ ආයතන වෙතින් රු. 63,600 ක් ව්‍යාපාර බදු ලෙස සභාවට අහිමි වී තිබුණි.

(ආ) සභාව මඟින් පාලනය කරනු ලබන ගැටහැත්ත ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් 31 දෙනෙකු වෙතින් රු. 33,852 ක හිඟ මුදලක් 2015 ජුනි වනවිටත් අයවීමට තිබුණි.

(ඇ) සභාව සතු වැසිකිලිය ත්‍රෛමාසික කාල සීමාවට අදාල බදු දීම සිදු කරන අතර, ඒ අනුව අදාල බදුකරුවන් වෙතින් රු. 17,917 ක ජල බිල්පත් සඳහා හිඟ මුදලක්ද විගණිත දිනය වූ 2015 මාර්තු 19 දින වනවිටද අයවීමට තිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්නපුර හා අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණ වෙතින් ලැබිය යුතු උසාවි දඩ ආදායම් හඳුනා ගැනීමට කටයුතු කර නොමැති අතර, අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණය මගින් 2013 දෙසැම්බර් දක්වා ලැබී තිබූ රු. 2,890,867 ක මුදලක් හා රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණ වෙතින් 2012 ජනවාරි මස දක්වා ලැබී තිබූ රු. 290,008 ක මුදලක් පමණක් ලේඛණගත කර තිබුණි.

(ආ) රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු 2014 අප්‍රේල් සිටද අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු 2013 ජනවාරි මස සිටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 <u>විදේශ ගමන් වියදම්</u>

i. පෞද්ගලික ආයතනයක් විසින් 2014 නොවැම්බර් 10 සිට 2014 නොවැම්බර් 15 දින දක්වා තායිලන්තයේදී පැවැත්වූ කසල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ සභිකයින් 15 දෙනෙකු වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතියක් තොරව අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස එකතුව රු. 1,999,590 ක්ද, පුහුණු ආයතනයට රු. 1,479,000 ක්ද වශයෙන් එකතුව රු. 3,478,590 ක මුදලම සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

ii. පළාත් පාලන නිළධාරියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් වැඩ සටහන සංවිධානය කරන ආයතනය ඒ සඳහා වැය වන සියළු වියදම් දැරිය යුතු බවට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම් උපදෙස් දී තිබියදී ගුවන් ටිකට්පත් ගාස්තුව, හෝටල් නවාතැන් පහසුකම්, ආහාර හා ගුවන් පහසුකම් සඳහා සභාපතිවරයා වෙනුවෙන් රු. 98,600 ක් සභා අරමුදලින් දරා තිබූ නමුත් නැවත සංයුක්ත දීමනා ලෙස දිනකට ඇ.ඩො. 250 ක් බැගින් දින 06 ක් සඳහා ශ්‍රී ලංකා මුදලින් රු. 194,250 ක් ගෙවා තිබුණි.

iii. විදේශීය පුහුණුව මගින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබාදිය යුතු වුවත්, උක්ත විදේශ සංචාරය අවසන් වී වාර්තාවේ දිනය දක්වා මාස 05 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, එවැනි ලියවිල්ලක් ඉදිරිපත් කර නොතිබුණි.

.

3.2 <u>වීථි ආලෝකකරණය</u>

i. වීථි පහන් සවිකල යුතු ස්ථාන නිසි පරිදි හඳුනාගැනීම සඳහා ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර, ගුණාත්මකභාවය පිළිබඳවද නොසලකා ප්‍රාදේශීය සභා තාක්ෂණික නිළධාරීගේ පූර්ව නිර්දේශයකින්ද තොරව රු. 1,526,950 ක් වටිනාකමැති වීථි පහන් මිලදී ගෙන තිබුණි.

ii. විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මඟින් වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් වන උපදෙස් පිළිබඳ සලකා බැලීමකින් තොරව වීථි ආලෝකකරණය ක්‍රියාත්මක වන අතර, වීථි පහන් සවිකිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇති කරගත් එකඟතාවයන්ද විගණනයට ඉදිරිපත් නොවුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා සීමාව තුල පිහිටි සුසාන භූමි අතරින් සුසාන භූමි 22 ක් පමණක් හඳුනාගෙන තිබුණද, ඒවාද මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් ලෙස පවරාගෙන ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණය ලේඛණය අනුව සේවය අතහැර යාම හෝ ස්ථාන මාරුවී යාම හේතුකොටගෙන නිළධාරීන් හා සේවකයින් 09 දෙනෙකු වෙතින් එකතුව රු. 63,583 ක් වූ හිඟ ණය ශේෂයක් සභා අරමුදලට අයකරගත යුතුව තිබුණි.

(ඇ) විවිධ කාර්යයන් වෙනුවෙන් සභාව විසින් රු. 5,148,828 ක තැන්පත් ප්‍රමාණයක් වර්ෂ 27 ක සිට රඳවාගෙන ඇති අතර, ඒවා විධිමත් පරිදි නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවෙන් විශ්‍රාම ගිය හෝ ස්ථාන මාරුවී ගිය නිළධාරීන් සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 2014 දෙසැම්බර් 31 දින වනවිට ගෙවිය යුතුව තිබූ රු. 133,385 ක මුදලින් සමාලෝචිත වර්ෂයේදී රු. 25,000 ක් ගෙවීම් කර තිබූ නමුත්, එකී නිළධාරීන්ගේ සේවා කාලය, දැනට සේවය කරන ස්ථානයන් හෝ ලිපිනයන්, අදාල නිළධාරීන් ජීවත්ව සිටින්නේද වැනි කිසිදු තොරතුරක් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) 2012 ජනවාරි මාසයේ සිට බැංකු සැසඳුමේ පවතින රු. 12,140 ක්වූ වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල විගණිත දිනය වනවිටද කිසිඳු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම හේතුවෙන් සභාවට ලබාගත හැකි ආදායම් මාර්ගයක් අහිමි වී තිබුණි.

(ආ) සභාව වෙත වෙනත් අමාත්‍යාංශ වෙතින් ලැබී ඇති වාහන 02 ක් සම්බන්ධයෙන් සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා රියදුරන් නොමැති බැවින් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 පෙබරවාරි මස වනවිටද කිසිඳු ප්‍රයෝජනයක් නොගෙන ගාල් කර තිබූ අතර, ඒවා ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉලුක්පිටිය දෙහිගහලියැද්ද මාර්ගය

------------------------------------------

ගිවිසුම්ගත වටිනාකම රු. 490,196 ක්වූ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ඉලුක්පිටිය දෙහිගහලියැද්ද හරහා ගංහතරවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා කියුබික් මීටර් 155 ක් වෙනුවෙන් රු. 309,982 ක් ගෙවීම් කර තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී රෝල භාවිතා කර මාර්ගය තැලීම නිසිලෙස සිදුකර නොමැති බව අනාවරණය විය. කුඹුරක් ගොඩකර ඉදිකරන මාර්ගයක් සංවර්ධනය කිරීමේ මෙම කාර්යය වෙනුවෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එලෙස අනුමැතිය ලබාගෙන නොමැති බවද විගණනයට නිරීක්ෂණය විය.

(ආ) <u>කඩා ඉවත් කල ගොඩනැගිල්ලේ සුන්බුන් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය</u>

ඇහැලියගොඩ නගරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ නගරයේ මාර්ගයට මායිම් වන ගොඩනැගිලි කොටස් ඉවත් කර තිබුණි.

i. සුන්බුන් අවශ්‍ය ස්ථාන වලට රැගෙන යාමේ ප්‍රවාහන වියදම් දැරීම ප්‍රාදේශීය සභාව මඟින් සිදු කිරීමටත්, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අදාල වියදම් ප්‍රතිපූර්ණය කිරීමට ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමකින් තොරව අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

ii. ඇහැලියගොඩ පොලිසිය අසල සිට තලගහමුල්ල දක්වා ඉවත් කරන ලද සුන්බුන් ඉවත් කිරීම සඳහා පිළියෙල කරන ලද එකතුව රු. 6,277,500 ක ඇස්තමේන්තු හා ප්‍රවාහන වියදම් ලෙස ඉදිරිපත් කරන ලද රු. 6,274,410 ක බිල්පත් සඳහා කාර්මික නිළධාරීගේ හෝ ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය හෝ අධීක්ෂණය සිදු වී තිබූ බව විගණනයේදී තහවුරු නොවුණි.

iii. උක්ත කර්මාන්තය සඳහා 2013 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු. 900,000 ක් සභා අරමුදලින් දරා තිබුණද, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් එකී මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

iv. අදාල දේපල අයිතිකරුවන් විසින් හෝ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉටු කල යුතු වැඩ කොටසක් ප්‍රාදේශීය සභාව මැදිහත් වීඉටු කිරීම හේතුවෙන් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සඳහා මුදල් ප්‍රතිපාදනය කර ගැනීම පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹ නොතිබීම නිසා උක්ත කර්මාන්තය වෙනුවෙන් වැය කරන ලද රු. 900,000 ක අත්තිකාරම් ගෙවීම හා ගෙවීමට ඇති ඉතිරි මුදල් පිළිබඳව ප්‍රාදේශීය සභාව අසම්භාව්‍ය බැරකමකට බැඳී තිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය